# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2025/18 - 2017 ජුනි මස 27 වැනි අඟහරුවාදා - 2017.06.27

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

**ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනත 15(1) වගන්තිය යටතේ නියමය**

මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍ය පාඨලී චම්පික රණවක වන මම, ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරි පනතේ 15(1) වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල අනුව මොරටුව මහනගර සභාව වෙත පැවරී ඇති ඉඩමක් වශයෙන් මෙහි පහත සඳහන් උපලේඛනයෙහි වඩා පූර්ණ ලෙස විස්තර කර ඇති ඉඩම අද දින සිට ක්‍රියාත්මක වන පරිදි නාගරික සංවර්ධන අධිකාරිය වෙත මෙම නියෝගය මගින් සතු කරමි.

පාඨලී චම්පික රණවක (පා. ම.),
මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍ය.

2017 ජුනි මස 20 වැනි දින,
මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය,
17 හා 18 මහල,
සුහුරුපාය,
බත්තරමුල්ල.

උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, මොරටුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මොරටුව මහනගර සභා සීමා බලප්‍රදේශය තුළ පිහිටි, බලයලත් මිනින්දෝරු හා තලමිතිකරු එම්. එස්. මෙන්ඩිස් මහතා විසින් මැන පිළියෙල කරන ලද සැලසුම් අංක 2398 හා 1980.11.30 දිනැති මානක සැලැස්මේ පෙන්නුම් කෙරෙන උතුරින් පී. ඒ. අල්විස් පෙරේරා මාවතට ද, නැගෙනහිරින් ඒ. ඒ. අමරාවතී සහ යූ. එන්. ප්‍රනාන්දු හිමිකම් කියන ඉඩම ද, දකුණින් එස්. ඩී. ෆ්‍රැන්සිස් අප්පුහාමි හිමිකම් කියන ඉඩම සහ, බටහිරින් ගාලු පාරට ද මායිම් වූ ප්‍රමාණයෙන් (අක්. 0, රූඩ් 0, පර්. 32.18) අක්කර බිංදුවයි රූඩ් බිංදුවයි පර්චස් තිස් දෙකයි දශම එකයි අටක් වූ වරිපනම් අංක 546 සහ 548 කටුබැද්ද ලෙස දක්වා ඇති ඉඩම.

07-306

**ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනත 15(1) වගන්තිය යටතේ නියෝගය**

ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනතේ 15(1) වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, මහා නගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍ය පාඨලී චම්පික රණවක වන මම, මෙම නියමයෙන් ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහ නගර සභා සීමාව තුළ, අංක 07, නුගේගොඩ කොට්ඨාසයේ පිහිටි මෙහි පහත උපලේඛනයෙහි සවිස්තරාත්මකව දක්වා ඇති ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ නගර සභාව සතු ඉඩම, මෙම නියෝගයේ සඳහන් දින සිට නාගරික සංවර්ධන අධිකාරිය වෙත පවරමි.

පාඨලී චම්පික රණවක (පා. ම.),
මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍ය.

2017 ජුනි මස 20 වැනි දින,
මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය,
17 හා 18 මහල,
''සුහුරුපාය'', සුභූතිපුර පාර,
බත්තරමුල්ල.

උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහ නගර සභා සීමාව තුළ අංක 07, නුගේගොඩ කොට්ඨාසයේ පිහිටියාවූ ද, ලියාපදිංචි බලයලත් මිනින්දෝරු සහ තලමිතිකරු ඩී. ජෝයි ද සිල්වා මහතා විසින් පිළියෙල කරන ලද අංක 70/2008 හා 2008.08.30 දිනැති සැලසුමෙහි කැබලි අංක ''A'' ලෙස සවිස්තරව පෙන්නුම් කර ඇත්තාවූ ද, ප්‍රමාණයෙන් (අක්කර 2, රූඩ් 1, පර්චස් 10) හෙක්. 0.9373ක් වූ ඉඩම.

| | | |
|---|---|---|
| *උතුරට* | : | ස්ටැන්ලි තිලකරත්න මාවත සහ පරණ කැස්බෑව පාර, |
| *නැගෙනහිරට* | : | පරණ කැස්බෑව පාර, |
| *දකුණට* | : | පාර, |
| *බටහිරට* | : | ස්ටැන්ලි තිලකරත්න මාවත. |

07-307

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.